**31.** (i) **"ව්‍යාපාර ආචාර ධර්ම" යන සංකල්පය පැහැදිලි කරන්න.**
(ii) **ව්‍යාපාරයක ආචාර ධර්ම තීරණය කිරීමෙහිලා බලපෑම් කරන ප්‍රධාන පාර්ශ්ව තුන නම් කරන්න.**

(i) ..........................................................................................................................................
..........................................................................................................................................

(ii) ..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

**32. ව්‍යාපාර ආචාර ධර්ම හා ව්‍යාපාර සමාජීය වගකීම යන සංකල්ප අතර වෙනස්කම් සඳහන් කරන්න.**

| ව්‍යාපාර ආචාර ධර්ම | ව්‍යාපාර සමාජීය වගකීම |
|---|---|
| 1. .................................................................... | 1. .................................................................... |
| 2. .................................................................... | 2. .................................................................... |
| 3. ව්‍යාපාර ආචාර ධර්ම යන්න පුළුල් සංකල්පයකි | 3. සමාජ වගකීම ආචාර ධර්ම තුළ අඩංගු ක්ෂේත්‍රයකි |
| 4. ව්‍යාපාර විසින් අනිවාර්යයෙන් පිළිපැදිය යුත්තක් ලෙස සැළකේ | 4. අනිවාර්යයෙන් කළ යුතු යැයි නියමයක් නොමැත |
| 5. උනන්දුවක් දක්වන පාර්ශ්ව වෙත මූලික වශයෙන් නැඹුරු වේ | 5. සමාජය වෙත පුළුල් ලෙස නැඹුරු වේ |

**33. ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම ව්‍යාපාරයකට කෙසේ වැදගත් වන්නේ දැයි හේතු හතරක් දක්වන්න.**

1. ..............................................................................................................
   - ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම තුළින් ගනුදෙනුකරුවන්ට සාධාරණය ඉටුවන අතර එමගින් ව්‍යාපාරය පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය ඉහළ යාම
2. ..............................................................................................................
3. ..............................................................................................................
   - අලෙවිකරණයට අදාළ ආචාර ධර්ම පිළිපැදීම තුළින් ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම සහ තරගකාරීත්වයට සාර්ථක ලෙස මුහුණ දිය හැකි වීම
4. ..............................................................................................................
   - සේව්‍ය සේවක අයිතීන් හා යුතුකම් සුරකින ආචාර ධර්ම තුළින් සේවකයින්ට, ජාති, කුල, ආගම් හෝ ස්ත්‍රී පුරුෂ ආදී වශයෙන් සිදුවන අසාධාරණකම් සිදු නොවීමෙන් මනා මානව සම්පත් කළමනාකරණයක් සිදු වීම
5. ගිණුම්කරණ කටයුතු තුළ සිදුවන අක්‍රමිකතා හා විෂමාචාර පිටුදැකිය හැකි වීම
   - ගිණුම්කරණ කටයුතුවලට අදාළ ආචාර ධර්ම පිළිපැදීමෙන් ව්‍යාපාරය තුළ සිදුවිය හැකි මූල්‍ය අක්‍රමිකතා / වංචා, විෂමාචාර පිටු දැකීම තුළින් විශ්වාසය තහවුරු වීම
6. සේවක ආකර්ෂණය පහසු වීම හා සේවක ප්‍රවාසිතාව, ශ්‍රම පිරිවැටුම අඩු වීම
7. ආයෝජකයන් පහසුවෙන් ආකර්ෂණය කරගත හැකි වීම
8. විකුණුම් වැඩි වී ලාභය වැඩි වීම
9. ආයතනයේ කීර්තිනාමය වැඩි වීම

**34. මෙරට ව්‍යාපාරවලින් සිදුවන හොඳ සහ නරක ක්‍රියාවන්ට නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරන්න.**

හොඳ ක්‍රියාවන්ට නිදසුන් ඃ

1. ගුණාත්මක භාණ්ඩ සැපයීම
2. සාධාරණ මිල අය කිරීම
3. ආචාරශීලීත්වය
4. ආපසු භාර ගැනීමේ ප්‍රතිපත්තිය
5. උපදෙස් සැපයීම
6. අනුග්‍රාහකත්වය සැපයීම
7. සාධාරණ වැටුප් ගෙවීම
8. සමානාත්මතාව සැලසීම
9. උපදේශාත්මක ප්‍රචාරණය

නරක ක්‍රියාවන්ට නිදසුන් ඃ

1. අසත්‍ය ප්‍රචාරණය / සන්නිවේදනය
2. පාරිභෝගිකයන් වෙත වැරදි අවබෝධයන් ලබා දීම
3. සංවිධානමය අපයෝජනයන්.

   නිද ඃ - කුඩා ළමුන් සේවයේ යෙදවීම

   - අධික පැය ගණනක් වැඩ ගැනීම
4. වංචා සහගත ලෙස මුදල් හෝ තැන්පතු රැස් කිරීම
5. තරඟය යටපත් කිරීම / තරඟ විරෝධී චර්යා
6. භාණ්ඩ බාල කිරීම හා පරිභෝජනයට නුසුදුසු දෑ මිශ්‍ර කිරීම
7. නිවැරදි කිරුම් මිණුම් භාවිත නොකිරීම
8. මිල වංචා
9. බදු වංචා
10. පරිසර දූෂණය

**35.** (i) **"ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතිය / සංග්‍රහය"** (Code of Ethics) **යනු කුමක් ද ?**
(ii) **ව්‍යාපාරික ආචාරධර්ම පද්ධතියක් සැකසීමේ දී සැලකිලිමත් විය යුතු සාධක දෙකක් උදාහරණ සහිත ව විස්තර කරන්න.**

(i) ..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(ii) 1. ............................................................ (Business)

ව්‍යාපාරයේ ස්වභාවය කුමක් ද, භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් ද , සේවා සපයන ව්‍යාපාරයක්ද, කුඩා පරිමාණ ව්‍යාපාරයක් ද, මහා පරිමාණ ව්‍යාපාරයක් ද ආදිය සැලකිල්ලට ගැනීම.

2. ............................................................ (Customers)

ගනුදෙනුකරුගේ ඉල්ලුම් රටා (ගැනුම් චර්යාව), මිල දී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සන්නිවේදනය, ආගමික සමාජ හා සංස්කෘතීන්ට අදාළ කරුණු පිළිබඳ ව සැලකිලිමත් වීම.

3. ............................................................ (Employees)

සේවක චර්යාව, සේවක විනය, සේවක දායකත්වය, කුමන මට්ටමේ සේවකයෙක් ද, ඔවුන්ගේ පරිසරය, අවශ්‍යතා හා වුවමනා පිළිබඳ සැලකිලිමත් වීම

4. ............................................................ (Competitors)

තරඟකරුවන් සිටී ද, තරඟකාරීත්ව ප්‍රතිචාර, උපාය මාර්ග සම්බන්ධ ඔවුන් අනුගමනය කරන ආචාර ධර්ම මොනවා ද, යන්න පිළිබඳව සැලකිලිමත් වීම

5. සමාජ සංස්කෘතිය (Socio culture)
ජන වර්ගය තුළ මුල් බැසගත් සංස්කෘතික සාරධර්ම හා අගනාකම්, උප සංස්කෘතීන් ගැන සැලකිලිමත් වීම

6. සංවිධාන සංස්කෘතිය (Organisational culture)
ව්‍යාපාරය තුළ පවතින චාරිත්‍ර වාරිත්‍ර, වටිනාකම්, පුරුදු, ආකල්ප යනාදිය පිළිබඳ ව සැලකිලිමත් වීම

7. ප්‍රායෝගික බව (Practicality)
ආචාර ධර්ම පද්ධති සකස් කිරීමේ දී එම ආචාර ධර්ම ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත් ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වීම

8. අයිතිකරුවන් (Owners)
ගුණාත්වය හා ලාභය පිළිබඳ සමබරතාව ගොඩ නැගීමට සම්බන්ධ ආචාර ධර්ම පිළිබඳව සැලකිලිමත් වීම

9. සැපයුම්කරුවන් (Suppliers)
අමුද්‍රව්‍යවල ගුණාත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය ආචාර ධර්ම පිළිබඳ සැලකිලිමත් වීම

10. කළමනාකරුවන් (Managers)
කළමනාකරුවන්ගේ දායකත්වය සැලසෙන පරිදි ආචාර ධර්ම ගොඩ නැගීම පිළිබඳ සැලකිලිමත් වීම

**36. ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු සිය නිෂ්පාදනවල ගුණාත්වය තහවුරු කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී, ඔහු විසින් සැලකිල්ලට ගත යුතු සාධක හතරක් සඳහන් කර, එම සාධක සැලකිල්ලට ගත යුත්තේ ඇයි දැ යි පැහැදිලි කරන්න.**

| | සාධක | හේතු |
|---|---|---|
| 1. | ............................................ | ............................................ ............................................ |
| 2. | ............................................ ............................................ | ............................................ ............................................ |
| 3. | නිෂ්පාදන ක්‍රියාවලිය (සේවකයින්) | සේවක චර්යාව හා සේවක විනය මෙන්ම සේවක දායකත්වය (ගුණාත්වය ඉහළ නැංවීමට අදාළව) සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට |
| 4. | ලාභයට වඩා සමාජ වගකීම (අයිතිකරුවන්) | ගුණාත්වය හා ලාභය පිළිබඳ සමබරතාව ගොඩ නැගීමට සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට |
| 5. | ආචාර ධර්ම සුරැකීම (තරඟකරුවන්) | තරඟකාරීත්ව ප්‍රතිචාර හා උපාය මාර්ග සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට |
| 6. | සංස්කෘතිය | සංස්කෘතික තත්ත්වයන්ට අනුකූලව ආචාර ධර්ම ගොඩ නැගීමට |
| 7. | කළමනාකාරීත්වය / කළමනාකරුවන් | කළමනාකරුවන්ගේ දායකත්වය සැලසෙන පරිදි ආචාර ධර්ම ගොඩ නැගීමට |

**37. සමහර ව්‍යාපාර ආයතන සිය ව්‍යාපාරයට අදාළ ආචාර ධර්ම ලිඛිතව ප්‍රකාශයට පත් කරයි. එම ආචාර ධර්ම පද්ධතියෙන් ආවරණය වන පාර්ශ්ව හතරක් නම් කරන්න.**

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

**38. පහත එක් එක් අවස්ථාවල දී වර්තමානයේ ඔබ හැසිරිය යුතු ආකාර දෙක බැගින් ලියා දක්වන්න.**

**1) බස් රියේ දී මඟියෙකු ලෙස 2) පාසලේ දී සිසුවෙකු ලෙස**

**3) නිවසේ දී දරුවකු ලෙස**

බස්රියේ දී මගියෙකු ලෙස

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................
5. බස්රථයට හානි නොකිරීම
6. පා පුවරුවේ ගමන් නොකිරීම
7. දුම්පානය හෝ බීමතින් ගමන් නොකිරීම
8. බැස යන ස්ථානය කල් වේලා ඇතුව දැනුම් දීම

පාසලේ දී සිසුවකු ලෙස

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................
5. නිතිපතා පාසල් පැමිණීම
6. නිල ඇඳුමින් සැරසී සිටීම
7. පාසල ආරම්භ කිරීමට පෙර ආගමික වතාවත් සිදු කිරීම
8. ජලය, විදුලිය අපතේ යාමට ඉඩ නොහැරීම
9. අපද්‍රව්‍ය පාසල තුළ නිසි ලෙස බැහැර කිරීම
10. ගුරුවරුන්ට, සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගෞරවයෙන් කටයුතු කිරීම
11. පාසල තුළ විනීතව හැසිරීම
12. විෂය බාහිර ක්‍රියාකාරකම්වලට සක්‍රීය ලෙස දායක වීම
13. පෙළ පොත් ඇතුලුව අනෙකුත් පාසල් සම්පත් සුරැකීම

නිවසේ දී දරුවකු ලෙස

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. තමන්ගේ වැඩ තමා විසින් සිදු කර ගැනීම
6. නිවස, මිදුල පිරිසිදුව හා අලංකාරව තබා ගැනීම
7. පවුලේ කටයුතු සඳහා සක්‍රීය ලෙස දායක වීම (උත්සව කටයුතුවල දී)
8. වියදම අඩුකර ගැනීමට දායක වීම (ජලය, විදුලිය වැනි සම්පත් පිරිමැසීම)
9. අත්මාර්ථකාමී හැඟීමෙන් ක්‍රියා නොකර පරාර්ථකාමී වීම

**39. ඔබගේ විද්‍යාලය සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් සැකසීමට ශිෂ්‍ය නායකයන් සහ ගුරු මණ්ඩලයකින් සමන්විත කමිටුවක් පත්කර ඇත. ඔබ එම කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙක් නම් විද්‍යාලය සම්බන්ධ ආචාරධර්ම සංග්‍රහයට ඇතුළත් කරන දෑ කවරේ දැයි සඳහන් කරන්න.**

සිසුන් සම්බන්ධව

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. පාසල ආරම්භ කිරීමට පෙර ආගමික වතාවත් සිදු කිරීම
6. ජලය, විදුලිය අපතේ යාමට ඉඩ නොහැරීම
7. අපද්‍රව්‍ය පාසල තුළ නිසි ලෙස බැහැර කිරීම
8. ගුරුවරුන්ට, සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගෞරවයෙන් කටයුතු කිරීම
9. පාසල තුළ විනීතව හැසිරීම
10. විෂය බාහිර ක්‍රියාකාරකම්වලට සක්‍රීය ලෙස දායක වීම

ගුරුවරුන් සම්බන්ධව

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. ප්‍රිය වචන කථා කිරීම
6. විෂය පිළිබඳව දැනුම රැස්කිරීම

**40. බස් රථයක ගමන් කරන මගියකු හා කොන්දොස්තර මහතකු විසින් පිළිපැදිය යුතු යැයි පොදුවේ පිළිගත් ආචාර ධර්ම දෙක බැගින් ලියන්න.**

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

**41. ශ්‍රී ලංකාවේ මහා මාර්ග අනතුරු සංඛ්‍යාව දිනෙන් දින සීඝ්‍රයෙන් ඉහළ යන බව වාර්තා වේ. එයට එක් ප්‍රධාන හේතුවක් වන්නේ රියදුරන්ගේ නොසැලකිලිමත්කම නිසා සිදු කරන වැරදි ක්‍රියා බව අනාවරණය වේ. ඔබ පෞද්ගලික මගී ප්‍රවාහන සේවා ආයතනයක හිමිකරු නම්, මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා ඔබේ රියදුරන් වෙනුවෙන් සකස් කරන ආචාරධර්ම පද්ධතියක ඇතුළත් කළයුතු ආචාර ධර්ම හතරක් ලියන්න.**

1. .................................................................................................................................
2. .................................................................................................................................
3. .................................................................................................................................
4. .................................................................................................................................
5. බීමත්ව රිය පැදවීමෙන් වැළැකීම
6. ජංගම දුරකථන වැනි උපකරණ භාවිත කරමින් රිය පැදවීමෙන් වැළැකීම
7. අධික මගීන් ප්‍රමාණයක් පටවා ගමන් කිරීමෙන් වැළැකීම
8. මාර්ග නීති රීති සුරැකීම
9. තරඟකාරී අයුරින් බස් රථ ධාවනයෙන් වැළැකීම
10. බස් රථයට මගීන් නැංවීමට හා බැසයාමට අවශ්‍ය කාලය ලබා දෙමින් බස් රථය නතර කිරීම

**42. සිසුන් කෙරෙහි ගුරුවරුන්ගේ වගකීම් මෙන් ම ගුරුවරුන් කෙරෙහි සිසුන්ගේ වගකීම් ද දැකිය හැක. එම එකිනෙක පාර්ශ්වයන්ගේ වගකීම් දෙක බැගින් ලියන්න.**

සිසුන් කෙරෙහි ගුරුවරුන්ගේ වගකීම්

1. .................................................................................................................................
2. .................................................................................................................................
3. ආදර්ශමත් චරිතයක් ලෙස ජීවත් වීම
4. සිසුන්ට සවන් දීම
5. ළමුන් නගන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
6. ජීවනාවබෝධය ලබා දීම
7. සැඟවුණු කුසලතා / අභ්‍යන්තර කුසලතා හඳුනාගෙන ඔප් නැංවීම
8. අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම
9. සෙනෙහස, දයාව දැක්වීම
10. යා යුතු මඟ පෙන්වා දීම හා ඒ මඟට යොමු කිරීම
11. සමානව සැලකීම
12. ළමා අයිතිවාසිකම් සුරැකීම

ගුරුවරුන් කෙරෙහි සිසුන්ගේ වගකීම්

1. ....................................................................................................................................
2. ....................................................................................................................................
3. සාවධානව ඇහුම්කන් දීම
4. විෂයෙහි කෙළ පැමිණීම / විශේෂඥයකු වීම
5. අවශ්‍ය සෑම විටම උපදෙස් ලබා ගැනීම
6. අනුගාමිකයකු ලෙස ක්‍රියා කිරීම
7. අධ්‍යාපන හා වෙනත් ජයග්‍රහණ ලබා ගනිමින් ගුරුවරයාගේ බලාපොරොත්තු මල්ඵල ගැන්වීම
8. වරද නිහතමානීව බාර ගැනීම හා ලබා දෙන දඬුවම් තුළින් තමා නිවැරදි වීම
9. කෘතගුණ සැලකීම
10. ගුරු පඬුරු පිළිගැන්වීම

**43. ඔබ හඳුනා ගන්නා ලද ව්‍යාපාරයකට ගැලපෙන ආචාර ධර්ම පද්ධතියක් ලුහුඬින් ලියා දක්වන්න.**

මාස් හෝල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම

1. Women go beyond - සිය ශ්‍රම බලකායෙන් 92% ක් කාන්තාවන් වීම හා ඔවුන්ගේ අධ්‍යාපනය නංවාලීම හා සවිබල ගැන්වීම (ඉංග්‍රීසි භාෂාව, තොරතුරු තාක්ෂණික දැනුම, රූපලාවන්‍ය, සෞඛ්‍යය, මූල්‍ය කළමනාකරණය, නිවස තුළ ව්‍යාපාර ඇරඹීම යනාදී පුහුණු ක්‍රම මගින් කාන්තාව තම ආයතනයේ රැකියාවට කොටු නොකර උසස් තැනකට යැවීමට සහාය දැක්වීම.

2. Lives Made Better - සිය ව්‍යාපාරය කෙරෙහි උනන්දුව දක්වන සියලු පාර්ශ්ව සවිබල ගැන්වීම

3. සේවක ගැටලුවක දී පළමුව ක්‍රමයේ වැරැද්ද, දෙවනුව පුහුණුවේ වැරැද්ද, තෙවනුව කළමනාකාරිත්වයේ වැරැද්ද, සිව්වනුව සේවකයාගේ වැරැද්ද ලෙස දැකීම. ඒ අනුව පළමුව සේවකයාට චෝදනා කිරීමේ සංකල්පයෙන් ඉවත් වීම

4. සේවක ගැටලුවක දී ඇයි යන ප්‍රශ්න පහකින් (5 whys ?) ප්‍රශ්නය හඳුනා ගෙන නිවැරදිව විසඳීම
5. නව්‍යතා තුළින් ජලය, විදුලිය යනාදී සම්පත් භාවිතය 75% කින් අඩු කිරීමෙන් තිරසර සංවර්ධන අභිමථාර්ථ සපුරා ගැනීමට දායක වීම
6. ගනුදෙනුකරුවන්ට ගුණාත්මක නිෂ්පාදිත සැපයීම
7. අවංකව හා සාධාරණව තරඟ කිරීම
8. සත්‍ය තොරතුරු ප්‍රචාරණය
9. තරඟකරුවන්ගේ ප්‍රතිරූපවලට හානි නොකිරීම

**44. නිෂ්පාදන, අලෙවි, මූල්‍ය, මානව සම්පත් යන ව්‍යාපාර ශ්‍රිත අතුරෙන් ඕනෑම දෙකකට අදාළ වන ආචාර ධර්ම ගැන කෙටි හැඳින්වීමක් කරන්න.**

නිෂ්පාදන

ගුණාත්මක භාණ්ඩ සාධාරණ මිලකට ලබාදීම, පරිසර හිතකාමී නිෂ්පාදිත බිහිකිරීම පිළිබඳ ආචාරධර්මයි.

නිද ඃ හරිත නිෂ්පාදනය, ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය, පේටන්ට් අයිතිය සොරා නොගැනීම.

අලෙවි

පාරිභෝගික අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම පිළිබඳ ආචාරධර්මයි.

නිද ඃ ගනුදෙනුකරු නොරැවටීම, මුලා නොකිරීම, නැති ගුණ හුවා දක්වමින් වැරදි ප්‍රචාරණ නොකිරීම

මූල්‍ය

විනිවිද භාවයකින් යුක්තව මූල්‍ය කටයුතු සිදු කිරීමයි.

නිද ඃ ගිණුම්කරණ කටයුතුවල විනිවිදභාවය, බදු වංචාවලින් වැළැකීම, ව්‍යාජ වියදම් වාර්තා නොකිරීම

මානව සම්පත්

සේවක යුතුකම් හා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමයි.

නිද ඃ සේවකයින්ට සමානව සැලකීම, සේවක හිංසනයෙන් වැළැකීම, වෘත්තීය ආරක්‍ෂාව

**45. ව්‍යාපාර ආචාරධර්ම කෙරෙහි ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයෝ එතරම් සැලකිල්ලක් නොදැක්වීමට හේතු දෙකක් සඳහන් කරන්න.**

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

**46. පහත සඳහන් ව්‍යාපාර ආචාරධර්ම සංකල්ප පැහැදිලි කරන්න.**

(i) **සත්‍ය දෑ සන්නිවේදනය කිරීම.**

(ii) **අන් අයට හානි නොකිරීම.**

(i) වැරදි හා නොමඟ යන සුළු ප්‍රචාරවලින් වැළකී සත්‍ය තොරතුරු පමණක් හෙළිදරව් කිරීම

(ii) වෙනත් ව්‍යාපාර ආයතනවල කීර්තිනාමයට හානි සිදුවන ආකාරයට කටයුතු නොකර තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම

S 1 / 2577 [F:\backup of D\ILSL\My Documens\Busi - Revision\ 2021 Q\ Social Responsibility innd (29.10.2019]